නංවා තිබුණේ මෙසේය.

මෙතැනට දක්නට ලැබෙන හාත්පස දර්ශනය සමහර විට ලෝකයේම දක්නට ලැබෙන ඉතාම විශිෂ්ට දසුන විය හැකිය. උසින් මෙය පරයා ඉහලට නැගුණ වෙනත් කඳු තිබිය හැකි වුවද මෙහිදී දක්නට ලැබෙන්නේ කිසිම බාධාවකින් තොරව ගොඩ බිම හා මුහුද එකම චිත්‍රයකින් යා කොට පෙන්වන අති විශේෂ දසුනකි. මෙහි සිට බලන සංචාරකයෙකුට උතුරු හා ඊසාන දෙසින් කඳුකර රාජධානිය වට කොට විරාජමාන වන කඳු පෙළද, දකුණු පසට වෙන්නට ඇස පෙනෙන තෙක් මානයේ දිග හැරෙන තැනිතලාව මත වියමන් කල රිදී රේඛා බඳු ගංගාද දැක ගත හැකිය. ඈත එපිට දම් පාට අවකාශයේ මුහුදු තීරය මත දිළිසෙන හිරු කෙඳි ඉන්දියන් සාගරයේ සීමාවන් සළකුණු කර දක්වයි.

*__මේ හුදකලා කඳු මුදුනේ මිනිස් අතකින් නිර්මාණය නොවූ මේ අසපුවේ සියළුම ජාතීන්ගේ ගාලගෝට්ටි උද්ඝෝෂණ වලට ඉහලින් කිසි දිනෙක නොනැසෙන වාසස්ථානයක සදාකාලිකවුත්, සර්වබලධාරී වුත් ශුද්ධාත්මයක් වැඩ වසන බවත් ඔහු අබියස අපගේ දෙපා රඳවාගෙන සිටින බවත් පමණක් අපි දනිමු.__*

මිහිරිතම දවසක පියන්පත් සෝබර ලෙස වැසී මිය ඇදෙන යාමයේ දික් වෙන සෙවනැලි ඡායා මැදින් මම පහලට ගමන් ඇරඹුවෙමි. ඒ අතරවාරයේ මම මගේ හදවතින් මෙසේ විචාලෙමි. මිලියන සංඛ්‍යාත වූ මගේ සහෝදර ජනතාව අතරින් බොහොමයක් මට වඩා නැණවත් හොඳ මිනිසුන්ය. ඔවුන්ගෙන් කී දෙනෙකු නම් බැතිබර කතෝලිකයින් විසින් ස්කෙලා සාන්තා හි ශුද්ධ වූ පිය ගැට පෙල මුදුනේ ඇති කුඩා බිම් කඩ වෙත දක්වන්නා වූ ගෞරවයෙන් යුතුව මා මේ පය තබා සිටින භූමියටද කවදාක නම් නිසි හරසර දක්වනු ඇතිද?

මා එසේ අසන්නට එකම හේතුව මෙයයි. මේ වළාකුළු රජදහනේ කඳු මුදුනේ මිනිස් පා සළකුණක් තිබීම හා මා බලාපොරොත්තු වන පිළිතුර අතර එතරම් සම්බන්ධයක් නැත. ඒවා ජනප්‍රවාද සමුහයක් පමණි. නමුත් ඒ හේතුකොට ගෙන මා සිතට ගලා ආ සිතුවිලි නම් රාශියකි. මා දැනගන්නට ආශා කරන එකම දෙය නම් මහම-දිකයින්, බෞද්ධයින් හා හින්දුන් මේ ස්ථානයේ මිනිස් පා සළකුණක් ඇති බව කෙසේ දැන ගත්තාද යන්නයි. මම තවදුරටත් මෙසේ ද අසනු කැමැත්තෙමි. මිහිපිට අන් කුමන ස්ථානයක මෙබඳු ආගමික වතාවතක් සිදුවේද? විසඳීමට අසීරු ගැටළු සැණෙකින් විසඳාලන තරුණ නැණවතෙකුගෙන් මෙය ඇසුවේ නම් ඩිකන්ස්ගේ නවකතාවල එන චක්පෝඩ් මුල් ගුරුතුමා මෙන් ඉතා සැහැල්ලු පිළිතුරක් පහසුවෙන් දෙනු ඇත. නමුත් වෙනත් ජාතියකට අයත්ව වෙනත් ඇදහිල්ලකට යොමුව මිහිපිට ඇති අති පූජනීය ස්ථානය මෙය යයි සිතා එකිනෙකාට ළංව දණ ගසා සිටින මේ සාමාන්‍ය මිනිසුන් කිතු දහමේ මත බේද වලට තුඩු දෙන තැන් නොදන්නා බව අප අමතක කල යුතු නැත. මගේ සිතට එකඟව සිතන කල ඔවුන් අපගේ විරෝධතාවයන්ටත්, අනුකම්පාවන්ටත් වඩා ඉහලින් සිටින බව මගේ විශ්වාසයයි. සොබා දහමේ රිද්මයට අනුව හෘද ස්පන්දනය වන කිසිවෙකුට මේ වළාකුළු රාජ්‍යයේ සිට අවට මහ පොළව දෙස බලද්දී දක්නට ලැබෙන උත්කෘෂ්ට දර්ශනයේ අද්භූත බලවේගය හා එහි ආශීර්වාදාත්මක බලපෑම පිළි නොගෙන සිටීමට කිසිදු හැකියාවක් නැත. සාන්ත පාවුළු දේවස්ථානය ගිනි ගෙන දැවී යා හැකිය. සාන්ත පීතර ඩෝමය කොයි මොහොතේ හෝ කඩා වැටෙනු ඇත. සෑම දිනයකම ඉර පායා බැස යනු ඇත. ඒ හා සමාන ස්ථිරතාවයකින් යුතුව මිනිසාගේ සෑම දැවැන්ත නිර්මාණයක්ම විනාශයට පත්වනු ඇත. නමුත් මෙහි, මේ හුදකලා කඳු මුදුනේ මිනිස් අතකින් නිර්මාණය නොවූ මේ අසපුවේ සියළුම ජාතීන්ගේ ගාලගෝට්ටි උද්ඝෝෂණ වලට ඉහලින් කිසි දිනෙක නොනැසෙන වාසස්ථානයක සදාකාලිකවුත්, සර්වබලධාරී වුත් ශුද්ධාත්මයක් වැඩ වසන බවත් ඔහු අබියස අපගේ දෙපා රඳවාගෙන සිටින බවත් පමණක් අපි දනිමු. කිරුළු දරා අළු වී යනතෙක් මිනිසා ඉතා වෙහෙසකර ගමනක යෙදෙන ආකාරය ඔහු කාලයේ ආශීර්වාදය ලැබ කාලාන්තරයක් තිස්සේ මෙහි සිට සන්සුන්ව බලා හිඳී.

***දිවයිනේ වෙසෙන විවිධ සතුන් ගැන විස්තර ලබන කලාපයෙන් ඔබ වෙත ගෙන එමු.***

පරිවර්තනය ශ්‍රියා කුමාරසිංහ


# ALG & ASSOCIATES

**FOR ALL YOUR TAXATION, ACCOUNTING & BOOKKEEPING NEEDS**

- Individual & Business Income Tax Returns (Partnership, Trust & Company)
- Self Managed Superannuation Funds
- Accounting & Bookkeeping
- Business Activity Statements (GST Returns) & Instalment Activity Statements
- Company Secretarial
- Business Consultants
- Tax Planning

**Arjuna Gunawardena CPA B.Ec**
Registered Tax agent

ABN 63 865 123 157
PO Box 1335 Glen Waverly 3150
Tel - (03) 9802 3322
Fax - (03) 9802 6654
Mobile - 0438 194 827
Email - aplus_ms@bigpond.net.au



# Have Peace of Mind....talk to us

**ඔබේ සිතට සැනසුම ලබාගන්න . . . අදම අප අමතන්න**



ඔබේ මූල්‍ය අවශ්‍යතාවයන්ට
අපෙන් නොමිලේ උපදෙස් හා සේවා රැසක්

Aplus Mortgage Solutions

We will help you to solve your financial needs.

We deal with reputed banks and other financial institutions.
We are confident of giving the fitting product to meet your needs.

**We can help you with**

Home Loans
Business Loans
Construction Loans
Lines of Credit
Debt Consolidation
Investment Loans
Low Doc and No Doc Loans
Commercial Loans
Zero Deposit Loans

We can also help you with a FREE Mortgage Health Check to see whether your present arrangements are adequate

MIAA ACCREDITED MORTGAGE CONSULTANT

Call our mortgage consultant
Arjuna Gunawardena CPA B.Ec
on (03) 9802 3322 0438 194 827
or e mail us aplus_ms@bigpond.net.au

Ace Financial Solutions Pty Ltd trading as Aplus Mortgage Solutions
ABN 49 111 011 182 P O Box 1335 Glen Waverley Victoria 3150
Telephone +61 3 9802 3322 Facsimile +61 3 9802 6654 Email aplus_ms@bigpond.net.au